<u>සංවර්ධන ලොතරැයි මණ්ඩලය - 2010</u>

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 මතය

මාගේ පරීක්ෂණයෙන් පෙනී යන අන්දමට සහ මට සපයන ලද උපරිම තොරතුරු සහ පැහැදිලි කිරීම් අනුව සංවර්ධන ලොතරැයි මණ්ඩලය 2010 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා නිසි ගිණුම් වාර්තා පවත්වා ඇති බවත් මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණු වලින් මල්‍ය ප්‍රකාශන වලට වන බලපෑම හැර 2010 දෙසැම්බර් 31 දිනට සංවර්ධන ලොතරැයි මණ්ඩලයේ ක්‍රියාකාරීත්වය පිළිබඳ තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මෙහෙයුම් කටයුතුවල මූල්‍ය ප්‍රතිඵල හා මුදල් ප්‍රවාහ සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති වලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බවත් මා දරන්නා වූ මතය වේ.

### 1.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම්

#### 1.2.1 ගිණුම්කරණ අඩුපාඩු

මණ්ඩලය ඒ ඒ අංශ වෙත නිකුත් කරන තොග වල නිවැරදි පිරිවැය තොග ලෙජර් ගිණුම් මගින් පිරිවැයට ගැලපීමකින් තොරව වර්ෂයේ ආරම්භක තොගයට මිලදී ගැනීම් එකතු කර අවසන් තොගය අඩුකිරීමෙන් ලැබෙන අගය තොග පිරිවැය ලෙස ගිණුම් වලට ගැළපීම නිසා තොග නැතිවීම් , සොරකම් කිරීම් සහ විනාශ වීම් නිසා සිදුවන පාඩු ගිණුම් වලින් හෙළිදරව් වී නොතිබුණි.

#### 1.2.2 අඩුවෙන් හා වැඩියෙන් දැක්වීම්

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) 2008 වර්ෂයේ දැයට කිරුළ ප්‍රදර්ශනයේ ටිකට්පත් වලට ත්‍යාග පිරිනැමීම වෙනුවෙන් එම වර්ෂයේදී මිලදී ගෙන තිබූ රු. 5,480 බැගින් වූ පිඟන් කට්ටල 332 ක හා රු. 6,000 බැගින් වූ තේ කෝප්ප කට්ටල 1,789 ක එකතු වටිනාකම රු.12,553,360 ක් සමාලෝචිත වර්ෂයේ ලාභයට එරෙහිව ලියා හැරීම නිසා වියදම් වැඩියෙන් හා වත්කම් අඩුවෙන් ගිණුම්වල හෙළිදරව් කර තිබුණි.

(ආ) ඉකුත් වර්ෂයට අදාල රු.16,381,903 ක වැඩියෙන් කරන ලද ප්‍රතිපාදන නිවැරදිව නොගැලපීම නිසා එම වටිනාකමින් ඉකුත් වර්ෂයේ ලාභය අඩුවෙන් හා සමාලෝචිත වර්ෂයේ ලාභය වැඩියෙන් ගිණුම්වල දක්වා තිබුණි.

### 1.2.3 ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) වෙළඳ හා පාරිභෝගික කටයුතු අමාත්‍යාංශය සමග එළඹි බදු ගිවිසුමකට අදාලව තබන ලද රු.723,780 ක තැන්පතුවක් අදාල ගිවිසුම අවසන් වී වර්ෂ 6 ක කාලයක් ගත වී තිබුණ ද නැවත අයකර ගැනීම සඳහා ප්‍රමාණවත් ක්‍රියා මාර්ග ගෙන නොතිබුණි.

(ආ) වර්ෂ 5 කට වඩා පැරණි රු.1,630,507 ක් වූ ණය හිමි ශේෂ 13 ක් නිරවුල් කිරීමකින් හෝ වෙනත් සුදුසු ක්‍රියාමාර්ගයක් ගැනීමකින් තොරව ගිණම්වල අඛණ්ඩව ඉදිරියට ගෙන එමින් පැවතුණි.

(ඇ) ගොඩනැගිලි බදු දීම වෙනුවෙන් අයවිය යුතු රු.4,976,220 ක් වූ බදු කුලී වර්ෂ 4 කට වැඩි කාලයක සිට අයකර ගැනීම සඳහා ප්‍රමාණවත් ක්‍රියා මාර්ග ගෙන නොතිබුණි.

(ඈ) රු.28,737,539 ක් වටිනා ණයගැති ගිණුම් සමාලෝචිත වර්ෂයේ අවසානයට සනාථ කර නොතිබුණි.

### 1.2.4 නීති,රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණ වලට අනුකූල නොවීම්

විගණනයේදී පහත සඳහන් අනුකූල නොවීම් අවස්ථා නිරීක්ෂණය විය.

| **නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණ වලට යොමුව** | **අනුකූල නොවීම** |
| --- | --- |
| (අ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි | |
| (i) මු.රෙ.371(2) (අ) | අවස්ථා 82 කදී රු.105,530 ක සුළු මුදල් අත්තිකාරම් ලබා ගැනීමේදී අවශ්‍ය අනුමැතිය ලබාගෙන නොතිබුණි. |
| (ii) මු.රෙ.371(2) (ඇ) | මුදල් රෙගුලාසිය ප්‍රකාර සළු මුදල් අත්තිකාරමක් ලබා ගත් නිලධාරියකු අදාල කාර්යය නිම කල විගසම අත්තිකාරම් පියවීම සිදු කල යුතු නමුත් මණ්ඩලයේ සේවකයන් වෙත ලබා දී තිබූ රු.393,078 ක් වූ අත්තිකාරම් පියවීම දින 28 සිට දින 245 ක කාලයක් දක්වා ප්‍රමාද කර තිබුණි. |

| | |
|---|---|
| (iii) මු.රෙ.371(2)(ආ) | වරකට රු.20,000 ට වැඩි තත්කාර්ය අතුරු අග්‍රිම අනුමත නොකළයුතු වුවත් මුදල් රෙගුලාසි වලට පටහැනිව මණ්ඩලය අවස්ථා 10 කදී එකතුව රු.397,896 ක වූ තත්කාර්ය අතුරු අග්‍රිම එම සීමාව ඉක්මවා අනුමත කර තිබුණි. |
| (iv) මු.රෙ.396 | චෙක්පත් නිකුත් කල දින සිට මාස හයක් ඇතුලත මුදල් කර නොගත් විට ඒවා නැවත ආදායමට ගත යුතු නමුත් මණ්ඩලයේ රු.159,970 ක් වටිනා නිකුත් කල චෙක්පත් වර්ෂ තුනකට කට වැඩි කාලයක් මුදල් රෙගුලාසි ප්‍රකාර කටයුතු නොකර ණයහිමියන් යටතේ දක්වා තිබුණි. |
| (v) මු.රෙ.762 | මුදල් රෙගුලාසිය ප්‍රකාර තොග මට්ටම් පවත්වා ගැනීම සඳහා මණ්ඩලය කටයුතු කර නොතිබුණි. (උදා:- අවම, උපරම සහ ප්‍රශස්ථ) එමෙන්ම සමහර තොග වර්ගවල තොග ඌනතා මෙන්ම වෙනත් තොග වල තොග අතිරික්තතා පවතින බවද නිරීක්ෂණය විය. |
| (vii) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 5.4.4 වගන්තිය | රජයේ සැපයුම් හා සේවා සම්බන්ධයෙන් දිය හැකි උපරම වැඩ ආරම්භ කිරීමේ අත්තිකාරම මුළු කොන්ත්‍රාත් වටිනාකමින් 20% නොඉක්මවිය යුතු නමුත් මණ්ඩලය අවස්ථා 09 ක දී එකතුව රු.12,766,750 ක් කොන්ත්‍රාත් වටිනාකමින් 50% සිට 75% දක්වා අත්තිකාරම් ගෙවා තිබුණි. |

## 2. <u>මූල්‍ය හා මෙහෙයුම් සමාලෝචනය</u>

### 2.1 <u>මූල්‍ය සමාලෝචනය</u>

#### 2.1.1 <u>මූල්‍ය ප්‍රතිඵල</u>

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව, සමාලෝචිත වර්ෂය සඳහා මණ්ඩලයේ මෙහෙයුම්වලින් වූ මූල්‍ය ප්‍රතිඵලය රු.මිලියන 937.93 ක ශුද්ධ ලාභයක් වූ අතර, ඊට අනුරූපව ඉකුත් වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලය රු.මිලියන 551.70 ක ශුද්ධ ලාභයක් වුයෙන් ශුද්ධ ලාභයෙහි රු.මිලියන 386.23 ක් හෙවත් 70 % ක වර්ධනයක් දැක්වුණි.

රු.මිලියන173.13 ක හා රු.144.07 ක හිමිකම් නොපෑ ත්‍යාග මුදල් පිළිවෙලින් ඉකුත් වර්ෂයේ හා සමාලෝචිත වර්ෂයේ ලාභය ගණනය කිරීමේදී ලාභයට එකතු කර තිබුණි.

### 2.1.2 විග්‍රාහාත්මක මූල්‍ය සමාලෝචනය

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) සමාලෝචිත වර්ෂය හා පසුගිය වර්ෂ 04 ක් තුල මණ්ඩලයේ ලොතරැයිපත් විකුණුම් වලින් ලැබී තිබූ ආදායම, එම ආදායමින් සංවර්ධන ලොතරැයි මණ්ඩල පනතේ 18(2) වගන්තිය ප්‍රකාර මෙහෙයුම් වියදම් අඩු කිරීමෙන් පසු ජනාධිපති අරමුදල හා වෙනත් ව්‍යවස්ථාපිත අරමුදල් වෙත ප්‍රේෂණය කල මුදල හා ආදායමේ ප්‍රතිශතයක් ලෙස ජනාධිපති අරමුදල හා වෙනත් ව්‍යවස්ථාපිත අරමුදල් වෙත ප්‍රේෂණය කළ මුදල් පහත දැක්වේ.

| වර්ෂය | ලොතරැයිපත් විකුණුම් වලින් ලැබුණ ආදායම | ජනාධිපති අරමුදල හා වෙනත් ව්‍යවස්ථාපිත අරමුදල් වෙත ප්‍රේෂණය කළ මුදල | ආදායමේ ප්‍රතිශතයක් ලෙස ජනාධිපති අරමුදලට හා වෙනත් ව්‍යවස්ථාපිත අරමුදල් වෙත ප්‍රේෂණය කළ මුදල |
|---|---|---|---|
| | | | % |
| 2006 | 3,761,749,339 | 942,467,000 | 25.05 |
| 2007 | 3,947,213,671 | 845,327,000 | 21.41 |
| 2008 | 4,259,779,178 | 655,883,000 | 15.39 |
| 2009 | 4,886,477,659 | 735,001,000 | 15.04 |
| 2010 | 5,266,907,459 | 888,511,000 | 16.86 |

ලොතරැයිපත් විකුණුම් වලින් ලැබෙන ආදායමේ ප්‍රතිශතයක් ලෙස ජනාධිපති අරමුදල හා වෙනත් ව්‍යවස්ථාපිත අරමුදල් වෙත ප්‍රේෂණය කර තිබූ මුදල 2006 වර්ෂයේ දී 25.05% සිට 2009 වර්ෂයේදී 15.04% දක්වා පිරිහීමට ලක් වී තිබූ අතර 2010 වර්ෂය වන විට 16.86% දක්වා සුළු වර්ධනයක් සිදු වී තිබුණි.

ජනාධිපති අරමුදලට හා වෙනත් ව්‍යවස්ථාපිත අරමුදල් වෙත මණ්ඩලය මගින් කර තිබූ අවම දායකත්වය හා දායක මුදල්වල ක්‍රමික පිරිහම පිළිබඳව මණ්ඩලයේ වියදම් ව්‍යුහයේ කඩිනම් සමාලෝචනයක් සිදු කල යුතුව තිබුණ බව විගණනයේදී අවධාරණය කෙරුණි.

(ආ) ලබා ගත හැකි වූ තොරතුරු අනුව, සමාලෝචිත වර්ෂය හා ඉකුත් වර්ෂ 3 ට අදාල වැදගත් අනුපාත කීපයක් පහත පරිදි වේ.

| | වර්ෂය | | | |
|---|---|---|---|---|
| | 2007 | 2008 | 2009 | 2010 |
| (අ) ලාභදායිත්ව අනුපාත | | | | |
| i. ශුද්ධ ලාභ අනුපාතය (ප්‍රතිශතය) | 17.96 | 13.25 | 11.29 | 17.96 |
| ii. ස්කන්ධය මත ප්‍රතිලාභ | 1.36 | 1.17 | 1.13 | 0.83 |
| iii. සාමාන්‍ය වත්කම් මත ප්‍රතිලාභ | 0.77 | 0.55 | 0.44 | 0.71 |
| (ආ) ප්‍රාග්ධන | | | | |
| i. ස්කන්ධය/මුළු වත්කම් | 0.58 | 0.52 | 0.43 | 0.70 |
| ii. ස්කන්ධය/ජංගම නොවන වත්කම් | 0.70 | 0.67 | 0.54 | 0.88 |
| (ඇ) ද්‍රවශීල වත්කම් | | | | |
| i. ජංගම වත්කම් අනුපාතය | 0.42 | 0.44 | 0.43 | 0.52 |
| ii. ක්ෂණික (ද්‍රවශීල) වත්කම් අනුපාතය | 0.25 | 0.32 | 0.30 | 0.38 |

## 2.2 මෙහෙයුම් සමාලෝචනය

### 2.2.1 මෙහෙයුම් අකාර්යක්ෂමතා

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) ඉකුත් වර්ෂයේ ආරම්භ කර තිබූ ඩබල් චාන්ස් ලොතරැයිය සඳහා ඉකුත් වර්ෂයේදී හා සමාලෝචිත වර්ෂයේදී පිළිවෙලින් රු.28,885,617 ක් හා රු.22,115,426 ක් ප්‍රචාරණ වියදම් දරා තිබූ නමුත් සමාලෝචිත වර්ෂයේ සිට එම ලොතරැයිය නවතා දමා තිබූ බැවින් ඉහත ප්‍රචාරණ වියදම ඵලරහිත වියදම් බවට පත වී තිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂය අවසානයට මණ්ඩලයේ පරිගණක මෘදුකාංග වල පිරිවැය රු.17,718,257 ක්වූ අතර එම පරිගණක මෘදුකාංග නඩත්තු කිරීම සඳහා වර්ෂයේ වැය කර තිබූ මුදල රු.17,847,760 ක් හෙවත් මුළු පරිගණක මෘදුකාංග පිරිවැයෙන් 101 % ක විය.

### 2.2.2 නිශ්ක්‍රීය සහ ඌන උපයෝජිත වත්කම්

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) පිරිවැය රු.1,098,040 ක් වූ තොග විෂයයන් 11 ක් වර්ෂ ගණනාවක සිට භාවිතයට හෝ වෙනත් අදාල කාර්යයකට යොදා නොගෙන ගබඩාවේ තබා තිබුණි.

(ආ) රු.4,340,160 ක් වටිනාකම වූ ගෑස් උඳුන් 294 ක් විදුලි බත් උඳුන් 70 ක් හා විකුණුම් ආවරණ 481 ක් නිශ්කාර්යයව ගබඩාවේ තබා තිබුණි. එම උපකරණ මිලදී ගැනීමට හේතු වූ කරුණු විමර්ශනය කර නොතිබුණි.

(ඇ) සමාලෝචිත වර්ෂයේ දී ආරම්භ කර තිබූ ඩබල් චාන්ස් ලොතරැයිය වෙනුවෙන් මිලදී ගෙන තිබූ රු.8,484,491 ක් වටිනා ලොතරැයිපත් තොගය එම ලොතරැයිය පැවැත්වීම නවතා දමා තිබූ බැවින් නිශ්ක්‍රීයව ගබඩාවේ තිබුණි.

(ඈ) 2010 වර්ෂය තුළදී ඉදිකරන ලද රු.16,795,252 ක් වටිනා චිත්‍රාගාරයක් හා රු.5,826,305 ක් පිරිවැය වූ විදුලි ජනක උත්පාදන යන්ත්‍ර ගොඩනැගිල්ලක් ප්‍රයෝජනයට ගෙන නොතිබුණි.

### 2.2.3 <u>අයවැය ලේඛනමය පාලනය</u>

අයවැයගත සහ තථ්‍ය ආදායම් හා වියදම් අතර සැලකිය යුතු විචලනයන් නිරීක්ෂණය වුයෙන් අයවැය ලේඛනය ඵලදායී කළමනාකරණ පාලන කාරකයක් ලෙස යොදාගෙන නොතිබූ බව දැක්වුණි.

## 3. <u>පද්ධති හා පාලන</u>

විගණනයේදී නිරීක්ෂණය වූ පද්ධති හා පාලන අඩුපාඩු මණ්ඩලයේ සභාපතිවරයාගේ අවධානයට වරින් වර යොමු කරන ලදී. පහත සඳහන් පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි විශේෂ අවධානය යොමු කළයුතු වේ.

(අ) ගිණුම්කරණය
(ආ) මානව සම්පත් කළමනාකරණය
(ඇ) වත්කම් කළමනාකරණය
(ඈ) අතුරු අග්‍රිම
(ඉ) වියදම් කළමනාකරණය
(ඊ) තොග
(උ) අත්තිකාරම්